කො/දේවි බාලිකා විද්‍යාලය - කොළඹ
පළමු වාර පරීක්ෂණය - 2016 (මාර්තු)

නර්තනය

11 ශ්‍රේණිය　　　　　　　　　　　　　　　　　කාලය පැය 01 යි

- අංක 01 සිට 25 දක්වා ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

01) ගද්‍යමය හා පද්‍යමය යන ස්වරූප දෙකම දක්නට ලැබෙන දේශීය කවි ගායනා විශේෂයක් වන්නේ,

i. පැල් කවි　　　iii. කුළු කවි
ii. ටීකා සී පද　　　iv. තාලම් කවි

02) "යුද්දෙටත් ඇවිත් සිඳු පිට"..... මෙම කවි ගායනය අයත් වන්නේ ........ නැටුමටය.

i. සවරන්　　　iii. කඩු
ii. තාලම්　　　iv. මෝල්ගස්

03) දේශීය වාද්‍ය භාණ්ඩ අතර ඝන වාද්‍ය භාණ්ඩයක් වන්නේ

i. හොරණෑව　　　iii. තාලම්පට
ii. හක්ගෙඩිය　　　iv. ගැටබෙරය

04) ගංසූරිය ලීයෙන් සෑදීමට වඩාත්ම උචිත වාද්‍ය භාණ්ඩය වන්නේ

i. දෙවොල් බෙරය　　　iii. ගැටබෙරය
ii. රබාන　　　iv. උඩැක්කිය

05) උඩරට නැටුමේදී බඹර හරඹය ලෙස නම් කරන්නේ

i. 9 වන ගොඩ සරඹයයි　　　iii. 10 වන ගොඩ සරඹයයි
ii. 11 වන ගොඩ සරඹයයි　　　iv. 12 වන ගොඩ සරඹයයි

06) "ගුහිති ගදිරිකිට - ගහිත ගදිරි ගුඳ" යන බෙර පදය වැයීමට උචිතම වාද්‍ය භාණ්ඩය වන්නේ

i. ගැට බෙරයයි　　　iii. තම්මැට්ටමයි
ii. දවුලයි　　　iv. දෙවොල් බෙරයයි

07) මළබෙර හා රනබෙර වාදනයේදී අසන්නාට ලැබෙන රසයන් වන්නේ පිළිවෙලින්

i. කරුණා රසය හා වීර රසයයි　　　iii. ශාන්ත රසය හා වීර රසයයි
ii. ශෝක රසය හා වීර රසයයි　　　iv. භයානක රසය හා වීර රසයයි

08) "අපි දැන් දක්වමු ඒ රඟ සබයට"...... යන කවි කොටස

i. ඔංචිලි වාරම් කවියක කොටසකි　　　iii. චාමර කවියක කොටසකි
ii. සවරන් කවියක කොටසකි　　　iv. ගොයම් කවියක කොටසකි

09) "අතක්ට ගෙන රබන් පොඩිය"..... යන රබන් කවියෙහි නාදමාලාව අනුව වැයීමට උචිත බෙර පදය වන්නේ ................ යන බෙර පදයයි.

i. ජිං ගත ගොගො
ii. දොම් කිට කිට දොම්
iii. දොං ජිංත ගත දොංත
iv. දො දොංත තකු දොං

10) කරදිය නැමති මුද්‍රා නාට්‍යයේ සිසිගේ චරිතය රඟපාන ලද නර්තන ශිල්පිනිය වූයේ

i. මිරැන්ඩා හේමලතා ය
ii. වජිරා චිත්‍රසේන ය
iii. උපුලි පනීභාරතය
iv. රූපිනි සෙල්වනායගම් ය

11) හඟුරන්කෙත, කොනකගල, යන ප්‍රදේශවල වඩාත් ප්‍රචලිතව පවතින්නේ

i. කෝලම් නාටකයයි
ii. බලි ශාන්තිකර්මයයි
iii. සොකරි නාටකයයි
iv. කොහොඹා කංකාරියයි

12) "කොක් හඬලන්නේ සොකරිය දෙසයි බලන්නේ......." යන කවි කොටස කියවෙන්නේ සොකරි නාටකයේ

i. සොකරියගේ කවි ගායනාවලය
ii. ගුරුහාමිගේ කවි ගායනාවලය
iii. වෙදරාළුගේ කවි ගායනාවලය
iv. පරයාගේ කවි ගායනාවලය

13) කොහොඹා කංකාරියේ ගායනය රහිත සියලු යක්දෙස්සන් නටන දීර්ඝතම නර්තන අංගයක් වන්නේ

i. අස්නේ නර්තනයයි
ii. ආවැන්දුමයි
iii. යක් තුන් පදයයි
iv. යක් ඇනුමයි

14) දෙවොල් මඩුවේ දැඩිමුණ්ඩ දෙවියන් වෙනුවෙන් නටන ඒකල නර්තනයක් වන්නේ

i. වාහල නැටීමයි
ii. දොළහ පෙළපාලියයි
iii. තෙල්මේ නැටීමයි
iv. අඹ විදමනය

15) පහන් මඩු ශාන්තිකර්මයටම ආවේණික වූ නර්තන අංග දෙකකි.

i. තොරන් යාගය, රාමායක්කම
ii. පන්දම් පද, යහන් දැක්ම
iii. කොලොන්න පද, කුරුම්බර ප්‍රජාව
iv. රාමා යක්කම, සීතායක්කම

16) රිද්මයානුකූල චලන සඳහා නර්තන නිර්මානයේදී වඩාත් උචිත ගීතයක් වන්නේ ........ යන ගීතයයි.

i. පිලේ පැදුර හේනට අරගෙන යනවා
ii. උඩරට කඳුකර සිරියා පරදන
iii. අක්කෙ අක්කේ අර බලන්නකෝ
iv. රත්න දීප ජන්ම භූමි ලංකා දීප

17) කථකලි නර්තනය ප්‍රචලිත කිරීම සඳහා දායක වූ රජ කෙනෙකි

i. 1 වන හෙන්රි රජු
ii. කොට්ටාරක්කාර තාම්පුරම් රජු
iii. මහාරාජ් භග්‍ය චන්ද්‍ර
iv. මහාරාජ් ගම්භීර් සිං

18) කථකලි නර්තනයේ ප්‍රධාන වාද්‍ය භාණ්ඩය වන්නේ

i. පුං බෙරය හා මද්දලයයි
ii. චෙන්ඩාව හා මද්දලයයි
iii. තබ්ලාව හා චෙන්ඩාවයි
iv. චෙන්ඩාව හා මෘදංගයයි

19) අද්‍යතන ජනමාධ්‍ය නිර්මානවල බෙහෙවින්ම දක්නට ලැබෙන්නේ

i. විවිධ ඉඟිනළු ක්‍රම සහිත නර්තනයයි
ii. සාම්ප්‍රදායික නර්තන වලින් බැහැර වූ නර්තනයයි
iii. ශාන්තිකර්ම හා බැඳුණ නර්තනයයි
iv. ගීත අනුව නිර්මාණය වූ විචිත්‍ර නර්තනයයි

20) විවිධ ප්‍රසංගයක් සංවිධානය කිරීමේදී ඔබට ලැබෙන ප්‍රධානම අභියෝගය වන්නේ

i. ගීත හා නැටුම් පිළිවෙලකට ගොඩ නැගීමයි
ii. සාමුහිකත්වයෙන් කටයුතු කිරීමයි
iii. කාල කලමණාකරනය කර ගැනීමයි
iv. සියලුම දෙනාගේ අදහස්වලට අනුව ක්‍රියා කිරීමයි

21) ශ්‍රී ලංකාවේ නර්තන ඉතිහාසය සම්බන්ධයෙන් ඓතිහාසික මූලාශ්‍ර වශයෙන් ගත හැක්කේ

i. වංශ කතා හා සංදේශ කාව්‍යයන්ය
ii. ලෙන් ලිපි හා ගල් කණු තොරතුරුය
iii. දේශාටන වාර්තා හා ජන ප්‍රවාද කථාය
iv. කැනීම් තොරතුරු හා සංදේශ කාව්‍යයන්ය

22) "තකට තකට තක තරිකිට කුංදක් තා තක ජිජි කුඳ" යන කස්තිරම භාවිත කරන්නේ

i. 12 වන ගොඩසරඹයටයි
ii. 9 වන ගොඩසරඹයටයි
iii. 10 වන ගොඩසරඹයටයි
iv. 11 වන ගොඩසරඹයටයි

23) මොහු සබරගමු නර්තන සම්ප්‍රදායේ ප්‍රවීන ගුරුවරයෙකි.

i. එන්.ඩී. සිරිබෝහාමි මහතා
ii. සවිරිස් සිල්වා මහතා
iii. ජේ.ඊ. සේදරමන් මහතා
iv. එම්.එච්. ගෝමිස් මහතා

24) කොහොඹා කංකාරියට පමණක් ආවේණික නර්තන අංග වේ.

i. දුනුමාලප්පුව. කෝල්පාඩුව, අස්නෙ
ii. කෝල් පාඩුව, අඹ විදමන, ආවැන්දුම
iii. ආවැන්දුම, අස්නේ, දේව කෝල්පාඩුවා
iv. හත් පදය, අස්නෙ, මරා ඉපැද්දීම

25) පහතරට නර්තනයේදී පමණක් භාවිත වචන වේ.

i. වඩිග පටුන, රිද්දි යාගය, යහන් දැක්ම
ii. නාරිලතා කෝලම, නාග රාක්ෂ, වඩිග පටුන
iii. වඩිගපටුන, අඹ විදමන, තෙල්මෙ
iv. දෙවොල් නැටීම, තෙල්මේ, වඩිග පටුන

• 26 - 40 දක්වා ප්‍රශ්නවලට වඩාත්ම නිවැරදි පිළිතුර තිත් ඉර මත ලියන්න.

26) පැපොල, වසූරිය වැනි වසංගත රෝගවලින් ආරක්‍ෂා වීමට ............................................ දේවතාවියට බාරහාර වීම ගැමි ජනයාගේ සිතුවිල්ලකි.

27) කොහොඹා කංකාරියේ ඌරා පසුපස මලය රජු පැමිණි ආකාරය පෙන්වන්නේ ........................................ නර්තනයෙනි.

28) තත්, ජිත්, තොං, නං, තා යනු බෙරයෙන් වාදනය කරන සතර ........................................ යි.

29) ඉබන් බතූතා ........................................ යුගයේදී පැමිණි දේශාටන වාර්තාකරුවෙකි.

30) දවුල අතීතයේ සිට ........................................ කාර්යය සඳහා යොදා ගත් අවනද්ධ භාණ්ඩයකි.

31) "හෙමින් හෙමින් මම ගේකට යන කලට" .......... යන ගැමි ගායනය .................... කි.

32) කරදිය මුද්‍රා නාට්‍යයේ ඉතා අලංකාර ගීත ගායනා කරන්නේ ........................................ විසිනි.

33) උඩරට නැටුම් කලාවේ පියා ලෙස සැලකෙන ........................................ ගේ උපන් නාමය පාණිස්ය.

34) දවුල වැයීම සඳහා යොදා ගන්නා කෝටුව ........................................ නමින් හඳුන්වයි.

35) නර්තන කලා ඉතිහාසය හා සම්බන්ධ සරස්වතී මණ්ඩපය සහ පැටදාගෙය ඉදිවූයේ ........................................ යුගයේදීය

36) මහබඹා කෝලම සාම්ප්‍රදායික වශයෙන් ........................................ පෙරහැරේ දක්නට ලැබේ.

37) මහනුවර යුගයේදී රාජ ප්‍රශස්ති, වන්නම් යනාදිය ගායනා කරන ලද ස්ථානය වන්නේ, ........................................ යි.

38) මාත්‍රා 3 + 4 දෙතිතට ගායනය කළ හැකි වන්නමක් වන්නේ ........................................ වන්නමයි.

39) තාලම්පට වැයීමේදී තිත් යන්න ඝණනාන්තය ලෙස ද තෙයි යන්න ........................................ ලෙස ද හඳුන්වයි.

40) "දුරත් බැලුම නොව ලඟත් බලන අය....." මෙම වන්නමේ මූලික බෙර පදය වන්නේ ........................................ ය.

(ලකුණු 40 කි)

|2|

## II - කොටස

කාලය පැය 02 යි

- පළමු ප්‍රශ්නය අනිවාර්ය වේ
- පළමු ප්‍රශ්නය ඇතුලුව තව ප්‍රශ්න 03 කට පිළිතුරු සපයන්න.

01) ශ්‍රී ලාංකීය ශාන්තිකර්ම අතුරින් කොහොඹා කංකාරිය උඩරට නර්තනයේ ප්‍රධානය ශාන්තිකර්මයයි මෙය මලය රජු හා සම්බන්ධ කථා පුවත්පත් ඇතුළත් පඬුවස් දෙව් රජුට වැළඳුනු දිව්දොස සුවකල ශාන්තිකර්මය ලෙස පුරාවෘත කථාවල ඇතුළත්ය.

i. දිව්දොස යන්න කෙටියෙන් හඳුන්වන්න.

ii. මෙය සුව කිරීමට සුකර අවතාරයක් ගෙන මලය රජුගේ උයන පාලු කලේ කවුද ?

iii. ආවැන්දුම යන නර්තන අංගය කෙටියෙන් හඳුන්වන්න.

iv. යක්දෙස්සන්ගේ ප්‍රධාන ඇඳුම් කට්ටලයේ කොටස් 4 ක් නම් කර ඒවා පළඳින ස්ථාන නම් කරන්න.

v. මෙහි ගායනය රහිත සහ ගායනය සහිත නර්තන අංග දෙකක් නම් කරන්න

vi. කොහොඹා කංකාරියේ නාට්‍යමය පෙළපාලි දෙකක් නම් කරන්න.

vii. මෙම ශාන්තිකර්මයේ පුරාවෘත කථාව හා සම්බන්ධ ස්ථාන තුනක් නම් කරන්න.

(ලකුණු 15 කි)

02)

i. සොකරි නාටකයේ ප්‍රධාන චරිත 4 ක් නම් කරන්න.

ii. ඉන් එකකට අයත් කවියක් ලියන්න.

iii. සොකරි නාටකයේ කථා පුවත කෙටියෙන් ඉදිරිපත් කරන්න.

(ලකුණු 15 කි)

03)

i. කථකලි නර්තන සම්ප්‍රදායේ වේශ නිරූපණය පිළිබඳ කෙටි විස්තරයක් කරන්න.

ii. එකී නර්තන සම්ප්‍රදායේ පහත සඳහන් කොටස් හඳුන්වන්න.

a. සංගීත සම්ප්‍රදාය

b. වාද්‍ය භාණ්ඩ

(ලකුණු 15 කි)

04)

i. මාත්‍රා 2 + 3 තාලයට අයත් වන්නමක බෙර පදය ප්‍රස්තාර කරන්න.

ii. මහ තනි තිතට අයත් වන්නමක එක් කවියක් අදාල තාල රූපයට අනුව ප්‍රස්තාර කරන්න.

iii. එම වන්නමේ අඩව්ව ලියන්න. (ප්‍රස්තාර කිරීම අනවශ්‍යයි)

(ලකුණු 15 කි)

05) පහත සඳහන් මාතෘකා අතරින් දෙකක් පිළිබඳ තොරතුරු ගෙනහැර දක්වන්න.

i. කෝලට්ටම්

ii. ටීකා සීපද

iii. කාවඩි නර්තනය

iv. ගැටබෙරය

(ලකුණු 15 කි)

06) දේශීය ශාන්තිකර්ම තුළින් මිනිස් වර්ගයා තුළ අන්‍යෝන්‍ය වශයෙන් සාරධර්ම සංරක්ෂණය වීමක් සිදුවේ. එක් ශාන්තිකර්මයක් ඇසුරින් මේ බව උදාහරණ සහිතව පහදන්න.

(ලකුණු 15 කි)

The National e-learning portal for General Education